# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2117/8 – 2019 අප්‍රේල් 01 වැනි සඳුදා – 2019.04.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජේ/366 මත්තෝනි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මත්තෝනි ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක වයිජ්/කේආර්වී/2016/279 හා 2016.12.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.2578 ක් පමණ වන පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – තලන්කුලි – ප්‍රමාණය: හෙක්. 0.2578 ක් පමණ**

උතුරට: වේළුපිල්ලේගේ බිරිඳ ලඩ්සුමී සින්නතුරෛ සීලින් සහ කන්දියා සිවකලුන්තු හිමිකම් කියන ඉඩමේ නම නොදන්නා ඉඩම; නැගෙනහිරට: කන්දියා සිවකලුන්තු හිමිකම් කියන ඉඩමේ නම නොදන්නා ඉඩම සහ සූනප්පු පාර; දකුණට: සූනප්පු පාර සහ තලන්කුඩි හෙවත් මඩත්තු මුරුගන් කෝවිල සහ පරිශ්‍රය හිමිකම් කියන ඉඩමේ නම නොදන්නා ඉඩම; බටහිරට: තලන්කුඩි හෙවත් මඩත්තු මුරුගන් කෝවිල සහ පරිශ්‍රය සහ වේළුපිල්ලේගේ බිරිඳ ලඩ්සුමී හිමිකම් කියන ඉඩමේ නම නොදන්නා ඉඩම.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2016/ඩබ්ලිව්එස්/210.
2019 පෙබරවාරි මස 06 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

04 – 502